# රජුගේ කාර්යභාරය කෙරෙහි භාරතීය රාජ්‍ය පාලන මූලධර්මවල බලපෑම

ජී.එම්.යූ. ප්‍රේමරත්න*

**සංක්ෂේපය**

ක්‍රි.පූ. තුන්වන සියවසේ එනම්, දේවානම්පිය තිස්ස යුගයේ ස්ථාවර වූ රජ පදවිය (බස්නායක, 2005:226) මගින් ජනතාව අපේක්ෂා කළ වගකීම් බොහෝ ය. රජ පදවියේ උපත සම්බන්ධයෙන් ද භාරතීය සෙවණැල්ල යම් ආකාරයකින් පිටිවහලක් වූ බව මූලාශ්‍රය විමසීමේදී එලෙසින්ම රජුගේ කාර්යභාරය කෙරෙහි ද භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම බලපෑවේ ද යන්න මෙහිදී විමර්ශනය කෙරේ. විශේෂයෙන් ම ලාංකීය පාලකයන් මනුස්මෘතිය, කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය වැනි භාරතීය මූලාශ්‍රය අධ්‍යයනය කළ බවට වංසකථා සාහිත්‍යයෙන් කොතෙකුත් නිදර්ශන ලැබේ (*ඌනපූරණසහිතො මහාවංසො*, 1996:63:03,78:09). එහෙයින් එවැනි කෘතීන්හි එන මූලධර්ම ඇතුළු භාරතීය රාජ්‍ය පාලන මූලධර්මවල බලපෑම රජුගේ කාර්යභාරය කෙරෙහිත් බලපෑවේ ද යන්න විමසා බැලීම වැදගත් ය.

**රජුගේ කාර්යභාරය**

රජු වශයෙන් ඉටු කළ යුතු කාර්යභාරය ගත් කල ඉන්දියාවේත්, ලංකාවේත් රජු ධාර්මික ව පාලන කටයුතු ගෙනයාම මූලිකකොට සැලකූ බව පෙනේ. වෛදික යුගයේ සිට ම ඉන්දියානුවෝ රජු ධර්මයෙහි ආරක්ෂකයා වශයෙන් සැලකූහ. ඒ නිසා ම ඔහු ධෘතවෘත වශයෙනුත් ධර්මාවතාර වශයෙනුත් (බෂාම්, 1995:147) හැඳින්වී ය. ප්‍රථම රජු වූ විරජස් අත්‍යර්ථයෙන් ම 'ධර්ම' රක්‍ෂා කරන බවටත් කිසිදු අවස්ථාවක ස්වකීය අභිමතය ලෙස ධර්ම උල්ලංඝනය කරමින් ක්‍රියා නොකරන බවටත් ප්‍රතිඥා දුන්නේ ය (*මහාභාරතය*, 2006:163-.164).

පාලිතයන්ගේ සිත් දිනාගෙන දිගු කලක් රාජානුශාසනා කිරීමට නම් ඡන්ද, දෝෂ, භය, මෝහ යන සතර අගතීන්ගෙන් වෙන්වීම ද දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන සතර සංග්‍රහ වස්තුවලින් සැලකීම ද අවශ්‍ය වේ. එසේ ම,

- දාන (දන් දීම)
- ශීල (සිල් රැකීම)
- පරිච්චාග (ත්‍යාගවන්ත බව)
- අජ්ජව (ඍජු බව)
- මද්දව (මෘදු බව)
- තපො (ආත්ම සංයමය)

* *තාවකාලික කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය,* manjuhis88@gmail.com

- අක්කෝධ (ක්‍රෝධ රහිත බව)
- අවිහිංසා (හිංසා නොකරන බව)
- ඛන්ති (ඉවසීම)
- අවිරෝධ (වෛර නැති බව)

යන දශරාජධර්ම ද නොයික්මවා රාජ්‍ය පාලනය ගෙනයන ලෙස ජාතක කථාවන්හි රජුට අනුශාසනා කෙරේ (*ජාතකට්ඨ කථා, I කොටස*, 2007:379-.392). එමෙන් ම දීඝ නිකායේ පැනෙන චක්කවත්තිසීහනාද සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, කූටදන්ත සූත්‍රය යනාදී සූත්‍ර ධර්ම යහපත් රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය මූලධර්ම පිළිබඳ මග හෙළි පෙහෙළි කරන සූත්‍ර ධර්මයන් ය (*සුමංගලවිලාසිනී නම් වූ දීඝනිකායට්ඨකථා, I කොටස*, 2014:190, 201, 269). බෞද්ධ විග්‍රහයට අනුව පාලකයා ධර්මය අනුව රට පාලනය කරන දැහැමි පුද්ගලයෙකු විය යුතු ය. පාලනය පිළිබඳ මූලධර්මය "ධර්මය" නම් වෙයි (මොරටුවගම, 2005:22). පාලි සූත්‍රවල "ධම්මිකෝ ධම්මරාජා" යන ප්‍රයෝගය නිරතුරුව ම දක්නට ලැබෙන්නේ එහෙයිනි. රජුගේ දැහැමි බව යටතේ රටවැසියා නොපෙළන බව, අවි ශක්තියෙන් ජනතාව යටපත් නොකරන ගතිය, අයුක්තිය, අසාධාරණය පිටුදැක යුක්තිය හා සාධාරණත්වය මත පිහිටා ක්‍රියාත්මක වන ස්වභාවය මූලික වශයෙන් ගැනේ (මොරටුවගම, 2005:22). රජු සිව්පා සතුන් වෙත ද ධාර්මික රක්ෂාවරණය සැලසිය යුතු ය.

මේ සිද්ධාන්ත අනුව රජු රට පාලනය කළ යුතු බව බෞද්ධ මූලාශ්‍රයේ ඉගැන්වේ. මේ අනුව පාලන කටයුතු ගෙනගිය පරමාදර්ශී රජුන් භාරත ඉතිහාසයේ දැකිය හැකි අතර මෙම ආභාසය ලංකාවට ද ලැබුණි. මහින්දාගමනයෙන් පසු ව මෙරට රාජ්‍ය ආගම බවට පත්වූයේ බුදුදහම යි. එසේ ම මෙරට පාලකයා බෞද්ධයෙකු විය යුතු බවට සම්මතයක් ද පැවතිණි. පූජාවලියේ මේ අදහස වඩාත් ව්‍යක්ත ආකාරයෙන් දක්වයි.

> "මේ ලක්දිව බුදුන්ගේ ම තුණුරුවන් භාණ්ඩාගාරයක් වැන්න.
> එසේ හෙයින් මේ ලක්දිව සම්‍යක්දෘෂ්ටි ගත් රජුන්ට ම සීහෙන හෙයින්
> උන්ගේ කුල ප්‍රවේණිය පවත්නේ ද ඒකාන්ත ම ය."
>
> (*පූජාවලිය*, 1926:656)

කෙසේ වෙතත් භාරතයේ රාජ්‍ය පාලන මූලධර්ම ලාංකේය රජුගේ කාර්යය සකස්වීම කෙරෙහි ද බලපෑ බව පෙනේ. ශ්‍රී ලංකාවේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේදී පැරණි රජවරුන් සතර සංග්‍රහ වස්තුවෙන් හා දශරාජ ධර්මයෙන් යුක්ත ව රට පාලනය කළ බවට බොහෝ සාධක ලැබෙන්නාක් මෙන් ම ලක්දිව රජවරු පිළිපැදිය යුතු ක්‍රියාමාර්ගය වූයේත් දශරාජ ධර්මය යි (ලියනගමගේ, 2006:232).

බුද්ධදාස රජු දශරාජ ධර්මයෙන් යුක්ත ව සිව් සඟරාවතින් ජනයාට සංග්‍රහ කළ බව මහාවංසයේ සඳහන් වේ (*සි.ම.ව.*, 1996, 37:108, 03). දෙවන උපතිස්ස රජතුමා දස පාරමිතා පුරමින් දශරාජ ධර්මයෙන් හා සතර සංග්‍රහ වස්තුවෙන් රට පාලනය කළේ ය (*සි.ම.ව.*, 1996,

37:181,07). සුලු මුගලන් රජු ද සිව් සඟරාවතින් ජනයාට සංග්‍රහ කළ බව සඳහන් වේ (*සි.ම.ව.,* 1996, 40:55, 21). තුන්වන කාශ්‍යප (*සි.ම.ව.* , 1996, 46:21-.24, 46), කුඩා අග්බෝ (*සි.ම.ව.,* 1996, 46:71-, 48) හයවන කාශ්‍යප (*සි.ම.ව.,* 1996, 51:43-, 71), දෙවන විජයබාහු (*සි.ම.ව.,* 1996, 80:09-, 217) යන රජවරුන් ද සතර සංග්‍රහ වස්තුවෙන් යුක්ත ව රට පාලනය කළ බව වංසකතා තොරතුරුවලින් පැහැදිලි වේ.

පළමුවන වික්‍රමබාහු රජතුමාගේ බිසව වූ සුන්දර මහා දේවිය විසින් පොළොන්නරුවේ පිහිටුවා තිබෙන ලද ටැම්ලිපියේ,

"දශරාජ ධර්ම නොකොපා මුළු ලක්දිව එක්සත් කර
රජ කළ සිරිසඟබෝ විජයබාහු..."
(*Epigraphia Zeylanica*, 1941, 67-72)

යනාදී වශයෙන් සඳහන් වේ.

"මෙ අප නර පවරා - මනු නය සිරිත් සපුරා
නොහැර සිව් සඟරා - ලොවට නිරතුරු කෙරෙයි සඟරා"
(*ගිරා සන්දේශය*, 1991, 127 කවිය, 374)

හයවන පරාක්‍රමබාහු රජු සිව්සඟරාවතින් ජනයාට සංග්‍රහ කළ බව ගිරා සන්දේශය දක්වන්නේ ඉහත ආකාරයට යි. එසේ ම මෙම පද්‍යයෙන් හෙළිවන වැදගත් කරුණක් ලෙස හයවන පරාක්‍රමබාහු රජතුමා භාරතීය රාජ්‍ය පාලන මූලධර්මයන්හි ආභාසය ලබාගත් බව සඳහන් කළ හැකි ය.

ඒ අනුව පුරාණ භාරතයේ මෙන් ම පුරාණ ලංකාවේ ද රජුගේ ධර්මිෂ්ඨ බව අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකූ බව පෙනේ. රජු අධාර්මික වුවහොත් රටට අයහපතක් සිදුවන බව ද භූමිකම්පා, ජල ගැලීම්, සුළි සුළං, භයානක රෝග පමණක් නොව, අසන්තුෂ්ටිය, දුගී දුප්පත්කම, අනාරක්ෂාව ආදිය ද පාලකයාගේ ක්‍රියා පටිපාටිය අනුව සිදුවන බව එදා භාරතීය ජනතාව විශ්වාස කළේ ය (පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ,2001,15). එහෙයින් එවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් පූර්ණ වගකීම භාරගත යුතු වන්නේ රජු ය. මෙම මූලධර්මය පැරණි ශ්‍රී ලාංකේය නරපතියන්ට ද පොදු වූ බව පෙනේ.

සිරිසඟබෝ රජු කල (ක්‍රි.ව.247-.249) දුර්භික්ෂයක් ඇති වූ බව සඳහන් වන අතර (*සි.ම.ව.*, 36:75,145) වර්ෂාව ද ඇණ හිටියේ ය. මෙම රජු කළේ තමන්ගේ ධාර්මික බව සිහි කරමින් අධිෂ්ඨාන කිරීම යි. එම අධිෂ්ඨානයේ බලයෙන් වර්ෂාව ලැබුණු බව මූලාශ්‍රයේ සඳහන් වේ.

' වැසි වැස දියෙහි මා නොඉල්පූ කල
මෙහි මැරෙන්නා වූ ද මම නොනැගිටින්නෙමි' යි හොත්තේය.
රජු මෙසේ හොත් කෙණෙහි ම සියලු ලක්දිව පිනවමින්
වැසි වැස්සේය..... (*සි.ම.ව.*, 1996, 36:76-.80,145)

මේ ආකාරයෙන් රජුගේ අධිෂ්ඨානය සඵල වී වර්ෂාව ලැබුණේ රජුගේ ධාර්මික බව නිසා යයි මූලාශ්‍රයට අනුව උපකල්පනය කළ හැකි ය. රජුගේ ධාර්මිකත්වය රටට සමෘද්ධියක් ඇති කරන බව ජනතාව ද විශ්වාස කළ අතර එහෙයින් ජනතාවගේ නිරන්තර ප්‍රාර්ථනය වූයේ 'රජු ධර්මිෂ්ඨ වේවා ' යන්න යි. වෙසෙසින් ම යම් පුන්‍ය කර්මයකින් පසු බෞද්ධයන් වර්තමානයේදීත් ප්‍රාර්ථනා කරන්නේ,

"රාජා භවතු ධම්මිකෝ" (ඉලංගසිංහ, මංගල, 2008, 33) යනුවෙනි.

ජාතක කතාවන්හි සඳහන් වන්නේ රජ දරුවන් අධාර්මික වූ කල්හි රාජ පුරුෂයන් ද, බ්‍රාහ්මණයන් ද, ගෘහපතීන් ද, දනව්වාසීන් ද ආදී වූ සියලු සත්ත්වයන් ම අධර්මිෂ්ඨ වන බව යි. එහෙයින් කම්පිත වන දේවතාවන් වැසි වසින්නට නොදෙන බවත් එවිට සී සෑමට හෝ වැපිරීමට නොහැකි බවත් පවසයි (*ජාතකට්ඨකථා*, 2007, 379-.392). එහෙයින් රජු දැහැමි ව රාජ්‍යය පාලනය කළ යුතු බව පවසන අතර මෙම ආකල්පය පැරණි ශ්‍රී ලංකාවේ ද පැවති බවට සාධක ලැබේ. ඔවුන්ගේ අදහස වූයේ අප මෙකල විශ්වාස කරන පරිදි යහපත් ආණ්ඩුව ජනතාවගේ දියුණුවට ඉවහල් වන බවට වඩා රජතුමා සදාචාර ධර්මය ආරක්ෂා කිරීමේ ආනුභාවය හේතුකොට ගෙන නියම කාලයට වැසි වසින බවත්, අස්වැන්න වැඩිවන බවත්, මහ පොළොව ගොවියාට එලදාව ලබාදෙන බවත් ය (පරණවිතාන, සෙනරත් සහ වෙනත් අය, 1964, 223.-224).

විශේෂයෙන් ම රජවරුන් ධාර්මික වීම පැරණි ශ්‍රී ලාංකේය ජනතාව ද අපේක්ෂා කළ බව,

"ධම්මො පවත්‍තතු චිරාය මුනිස්සරස්ස
ධම්මෙඨිතා වසුමතීපතයො භවන්තු
කාලෙ පවස්සතු සනො නිඛිලා පජා ච
අඤ්ඤොඤ්ඤමෙත්ති පටිලාභසුඛං ලභන්තු " (*සද්ධර්මාලංකාරය*, 2011,895)

යන සද්ධර්මාලංකාර පාඨයෙන් ද, වැලිවිට සංඝරාජ හිමියන් දක්වන,

" චිරං තිට්ඨතු සද්ධම්මො
කාලෙ දෙවො පවස්සතු
ලොකං පාලෙන්තු රාජානො
තථා ධම්මේන සබ්බදා" (*සාරාර්ථ සංග්‍රහය*, 1929,230)

යන සාරාර්ථ සංග්‍රහ පාඨයෙන් ද පැහැදිලි වේ. කෞටිල්‍ය සඳහන් කරන්නේ රජු අධර්මය හා අනර්ථකාරී දෙය නොකළ යුතු බව යි.

"අධර්ම සංයුක්තං චානර්ථසංයුක්තෙ ච ව්‍යවහාරම්"
(*කෞ.අ.ශා.*, 2003, 1-2 අධිකාරය, 163:02-03,164)

රටේ ප්‍රථම පුරවැසියා ලෙස සලකන්නේ රජතුමා ය. (ඉලංගසිංහ, 2008,33) ඒ අනුව රටවැසියාට ආදර්ශවත් වීම සඳහා රජු ආදර්ශවත් චරිතයකින් සමන්විත වීම අවශ්‍ය වේ. රජු අධාර්මික නම් සීනි හා ලුණු වැනි දෙයෙහි පවා ස්වභාවික රසය නැති ව යන බව ජාතක කථාවන්හි සඳහන් වන්නේ එබැවිනි (ජාතකට්ඨ කථා, 2007, 379).

රජු වැසියා වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යභාරය අතරින් ඉතා ම වැදගත් කටයුත්තක් වන්නේ ජනතාව ආරක්ෂා කිරීම යි. යුරෝපීය දේශපාලන සංවිධානය දෙස බැලීමේදී රජු වගකිව යුතු වූයේ දෙවියන්ට පමණි (ඉලංගසිංහ, 2008,33). එහෙත් භාරතීය දේශපාලන සංවිධානය යටතේ රජුගේ කාර්යයන් මීට හාත්පසින් ම වෙනස් විය. එනම්, රජු ජනතාවගේ සේවකයෙකු බව භාරතීයයන්ගේ අදහස යි. ශුක්‍ර නීතිසාරයේ රජු ජනතාවට සේවය කළ යුත්තේ ඔවුන්ගේ සේවකයෙකු ලෙස බව දක්වේ (Shukra Neethisara, 1915, 4:2,130). ජනතාව නිෂ්පාදනය කරන දෙයින් හයෙන් එකක් පරිභෝජනය කරමින් රජු ජනතාව ආරක්ෂා කළ යුතු බව බෞද්ධායන ධර්ම සූත්‍රයෙහි සඳහන් වේ.

'ෂඩ්භාග භෘතො රාජා රක්ෂයේත් ප්‍රජාං' (සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය, 1965,645)

"ඔබ මෙන් ම මමත් වැටුප් ලබන සේවකයෙක් වෙමි.

මේ රට භුක්ති විඳිය යුත්තේ ඔබත් මාත් විසිනි."

(කෞ.අ.ශා., 2003, අධිකාර 10, 150:27,119)

යන කෞටිල්‍ය අර්ථශාස්ත්‍ර පාඨයෙන් ද අදහස් වන්නේ එය යි. වසභ රජුගේ පෙරුමියම් කුලම් ගිරිලිපියේ,

" ස කොටසහි එක කොටස පති" (E.Z., vol.I,255)

යනුවෙන් සඳහන් වන අතර ඒ මගින් නිෂ්පාදනය කළ අස්වැන්නෙන් හයෙන් එකක් බදු අය කරගත් බව පැහැදිලි ය. රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ ඉඩම් බද්ද පුරාතන ලංකාවේ අය කරගත්තේ හයෙන් එකක් බව බුත්සරණේ ද කියැවී ඇත.

"රටින් සයෙන් එකක් වළඳ දැහැමෙන් සෙමින් රාජ්‍යය කොට....." (*බුත්සරණ*, 1998,09)

ඇතැම්විට මෙසේ බදු ලබාගත්තේ රජු ජනතාව වෙනුවෙන් කරන සේවය වෙනුවෙන් වන්නට ඇත. බෞද්ධ සූත්‍ර ධර්ම තුළින් ද මේ බව පැහැදිලි වේ. විශේෂයෙන් ම අග්ගඤ්ඤ සූත්‍රයේ රජු ලෙස පත් කරගත් පුද්ගලයා ජනතාවට සලසන සේවය වෙනුවෙන් හැල්වලින් කොටසක් දීමට පොරොන්දු වී තිබේ. (*සුමංගලවිලාසිනී නම් වූ දීඝනිකායට්ඨකථා*, 2014,211) මනු සඳහන් කරන්නේ තම රාජ්‍යයේ කටයුතු සංවිධානය කොට රජු ප්‍රවේශමින් හා ධෛර්යයෙන් යුතු ව තම වැසියා ආරක්ෂා කළ යුතු බව යි.

" ඒවං සර්වං විධායේදමිති
කර්තව්‍යමාත්මනඃ
යුක්තශ්චෛවාප්‍රමත්තශ්ච
පරිරක්ෂේදිමාඃ ප්‍රජාඃ"
(*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 7:142,311)

එසේ ම රජු බලා සිටියදී වැසියෙකු උදව් ඉල්ලා කෑ ගැසූ විට සොරුන් විසින් පැහැරගෙන යනු ලැබුවේ ද එසේ බලා සිටින රජු රජෙක් නොව, මළ මිනියක් බව (*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001, 7:142,311) ඔහු වැඩි දුරටත් සඳහන් කරයි. මනුගේ තවත් අදහසක් වන්නේ රජුගේ උතුම් ම කටයුත්ත යටත් වැසියන් ආරක්ෂා කිරීම බව යි. ජනතාවගේ අයබදු භුක්ති විඳින රජු එම කටයුත්ත කිරීමට නීතියෙන් ද බැඳී සිටින බව ඔහුගේ අදහස යි (*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය*, 2001,312). නාරද ස්මෘතියෙහි පැහැදිලි ව සඳහන් වන්නේ ජනතාව රජුට බදු ගෙවන්නේ ඔවුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ම බව යි (*නාරද ස්මෘති,* 111,10).

මෙම මූලාශ්‍රය විමසීමේදී පෙනී යන්නේ රජුගේ තත්ත්වය කිසිදු අවස්ථාවක අවප්‍රමාණ නොකළ ද රජු ජනතාවගේ සේවකයෙකු පමණක් යන මතයේ බොහෝ ලේඛකයන් රැඳී සිටි බව යි. නමුත් ධර්මාශෝක අධිරාජයාගේ මතය මීට වඩා වෙනස් බව රජු විසින් පිහිටවනු ලැබ ඇති ශිලාලේඛනවලින් පැහැදිලි වේ. එනම්, අශෝක රජතුමාගේ මතය වූයේ පියෙක් දරුවෙකු රකින්නාක් මෙන් රජු රටවැසියන් රැකිය යුතු බව යි. ධෞලි අන්‍යතර ගිරිලිපියේ,

"සියලු ප්‍රජාව මාගේ දරුවෝ වෙති. මගේ ම දරුවන් මෙන් මෙලොව හා
පරලොව හිතසුවයෙන් ඔවුන් පසුවිය යුතු ය. "
(ආරියසිංහ, අභය, 2000,34)

යනුවෙන් එන සඳහනෙන් එය පැහැදිලි වේ. ඒ අනුව අශෝක රජු තමා ජනතාවගේ සේවකයෙක් ලෙස සැලකීමට වඩා ජනතාවගේ පියා තමන් බව ප්‍රකාශ කළ බව පෙනේ. ස්වාමි- සේවක බැඳීමට වඩා පීතෘ දාරක සබැඳියාව උසස්කොට සැලකූ බව පෙනේ. අශෝක රජු පවසන්නේ,

"ආහාර බුදිමින් හෝ අන්තඃපුරයේ හෝ ඇතුළු රජගෙයි හෝ සිටින විට ද
කැසිකිළියෙහි, වැසිකිළියෙහි, දෝළාවේ හෝ උයනෙහි හෝ සිටින විට ද
සෑම කාලයෙහි ම මහජනයාගේ කටයුතු පිළිබඳ වාර්තා සපයනු පිණිස
ප්‍රතිවේධකයෝ ම විසින් හිඳුවන ලදහ. මේ සියලු තන්හිදීම
ජනතාවට යහපතක් සලසමි. " (ආරියසිංහ, 2000, පි.34)

යනුවෙනි. එසේ ම මෙවැනි අදහසක් ම කෞටිල්‍ය විසින් ද ඉදිරිපත් කොට තිබේ.

"ප්‍රජා සුඛේ සුඛං රාඥඃ
ප්‍රජානාං ච හිතෙහිතම්
නාත්මප්‍රියං හිතං රාඥඃ
ප්‍රජානාං තු ප්‍රියං හිතම්"

(*කෞ.අ.ශා.*, 2003, 1.-2 අධිකාර, 18:34,104)

එසේ ම ඔහු තවදුරටත් පවසන්නේ රජු රාජ සභාවේ හිඳින කල්හි තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට හා මහජනතාවට තමා හමුවීමට ඇති ඉඩකඩ අවුරා එම කටයුතු පහළ ශ්‍රේණියේ නිලධාරීන්ට පවරන්නේ නම් ඔහු රාජ්‍ය පාලන කටයුතු ඒකාන්තයෙන් ම අවුල්කොටගෙන මහජන අප්‍රසාදයට ලක්වන අතර එහෙයින් ම තම විරුද්ධවාදීන්ගේ ගොදුරක් බවට පත්වන බව ය. එමෙන් ම රාජසභාවේ හිඳිනා විට තමා හමුවීමට එන අභියාචකයන් එහි දොරකඩ අසල කල් ගෙවමින් රැඳී සිටීමට ඉඩ නොතැබිය යුතු බවත් පවසයි. (*කෞ.අ.ශා.*, 2003, 16.30, 98)

මෙම භාරතීය මූලධර්ම ලාංකීය පාලකයන් තුළ ද පැවති බව පෙනේ. (මොරටුවගම, 2005,30) සැබැවින් ම මහජනයා රජෙකු පත්කර ගන්නා ලද්දේ රටවැසියාගේ ශුභසිද්ධිය පතා ය. රටවැසියාගේ ගැටලු විසඳා ගැනීම සඳහා ය. කෙසේ වෙතත් කෞටිල්‍ය සඳහන් කර ඇති යට දක්වන ලද ප්‍රකාශය තුළින් ලබාදෙන අදහස අනුව කටයුතු කළ පාලකයන් ලංකා ඉතිහාසයෙන් ද හමුවේ.

භාතිය රජතුමා (ක්‍රි.ව.143-.167) රාජ සභාවේ හිඳින අවස්ථාවකදී පහළ උසාවියකින් ලැබුණු නඩු තීන්දුවක් කෙරෙහි අපැහැදුණු වැසියෙක් රජු වෙත අභියාචනා ඉදිරිපත් කළ විට අන් සියලු කාර්යයන් පසෙක තබා එදින හිරු බැස තුරු ම ඔහුගේ නඩුව විනිශ්චය කළ බවට වංසත්ථප්පකාසනියේ එන පාඨය (*වංසත්ථප්පකාසිනී,* 2006, 34:38.41,505) සහ කෞටිල්‍යගේ ඉහතින් දක්වන ලද ප්‍රකාශය තුළින් ලබාදෙන අදහස අතර ඇත්තේ සමානතාවකි.

ඇතැම් භාරතීය ලේඛකයන් පවසන පරිදි රජුගේ ශරීරය පවතින්නේ තම සුඛ විහරණය සඳහා නොව, ප්‍රජාව ආරක්ෂා කිරීම සහ ධර්මය පවත්වා ගැනීම සඳහා ය (*කෞ.අ.ශා.*, 2003, 1.2 අධිකාර, 18.34,104). මෙය බෞද්ධ චින්තනයේ එන බෝධිසත්ත්ව චර්යාවට සමාන බව පෙනේ. ඒ අනුව සම්, මස්, ලේ සහිත රජෙකුගේ ශරීරය පවතින්නේ ලෝකාර්ථචර්යාව උදෙසා බව පැවසේ. මෙම බෞද්ධ සිද්ධාන්ත පැරණි ලාංකීය පාලකයන්ට ද ලැබුණා නිසැක ය. (බස්නායක, 2005,226)

නීතිරීති, සිරිත්විරිත් අනුව රට පාලනය කිරීමත්, ජනතාව ආරක්ෂා කිරීමත් සඳහා රජු තෝරාගනු ලැබූයේ යැයි අභිෂේකයේදී රජුට සිහිපත් කරන ලද බව වංසත්ථප්පකාසනියෙන් පැහැදිලි වේ (ව.ප., 2006,230). විශේෂයෙන් ම මේ තත්ත්වය පැවතියේ ඉන්දියාවේ ය (ව.ප., 2006,230). නමුත් අශෝක අධිරාජයාගේ ඉල්ලීම මත පැවැත්වූ දේවානම්පියතිස්ස රජුගේ පුනරාභිෂේකය හෙවත් ද්විතීය අභිෂේකයේදී ද මෙම පිළිවෙල අනුගමනය කරන ලද බව

වංසත්ථප්පකාසනියට අනුව පැහැදිලි වේ. ඒ අනුව රජු තම යුතුකම් පැහැර හැරියහොත් ඔහුගේ හිස සත් කඩකට පැළී යේවා යි සාප කරනු හා මෙම ප්‍රකාශය සම වන බව වංසත්ථප්පකාසනිය දක්වයි.

> "ඔවුන් රැකවරණ යොදා ආරක්ෂා කරනු මැන. ඉදින්, ඔබ අපගේ වචනයට අනුරූප වන පරිදි රාජ්‍යය කළහොත් යෙහෙකි. එසේ නොකළහොත් ඔබගේ හිස සත් කඩක් ව පැළී යේවා'යි සාප කරනු හා සම වන්නේ ය යි දත යුතු යි " (*ව.ප.,* 2006,231)

ජනතාව ආරක්ෂා කිරීම රජුගේ ප්‍රධාන කාර්යයක් වූ බව මහාවංසයෙන් ද පැහැදිලි වේ (*සි.ම.ව.*, 1996, 36:80.90,145). පඩුවස්දෙව් රජ වංසකතාවේ හඳුන්වා ඇත්තේ "ලංකාරක්ෂක පඩුවස්දෙව් රජ තෙමේ" යනුවෙනි (*සි.ම.ව.*, 1996, 9:28,39). ඇතැම් අත්තනෝමතික රජවරුන් සිටි බව සැබෑ නමුත් රජවරුන්ගේ මූලික ප්‍රතිපත්තිය ලෙස සලකන ලද්දේ මහජන සුභසිද්ධිය ම ය (ගුණරත්න, 1966,44). රජු රටවැසියා සහ රාජ්‍යය ආරක්ෂා කළ යුතු බව පූජාවලියේ සඳහන් වන්නේ මේ ආකාරය ට යි.

> "ලංකාධිපති රජුන් විසින් බුදුන් කෙරෙහි ස්වභාව වූ ආදර බහුමානයෙන් ද ශාසන ප්‍රතිෂ්ඨාවෙන් අප්‍රමාද ව ආඥාචක්‍ර- . ධර්මචක්‍ර රක්ෂාකොට රාජ්‍යය, කුල ප්‍රවේණිය, රක්ෂා කළ යුතු..............." (*පූජාවලිය*, 2013,746)

මේ ආකාරයෙන් ජනතාව ආරක්ෂා කිරීම රජුගේ ප්‍රධාන කාර්යයක් වූ අතර විජය රජුගේ සිට ම ඊට අදාළ තොරතුරු ලැබේ. මේ වනවිට භාරතයේ සම්මත ව පැවති සම්ප්‍රදායයන් විජය විසින් මෙරටට ගෙනැවිත් අනුගමනය කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

එසේ ම නියඟ, දුර්භික්ෂ වැනි ජාතික විපත්ති ඇති වූ විට ඒවා තුරන් කිරීම පිණිස පිළියම් යෙදීම ද රජුගේ කාර්යයක් විය (බස්නායක, 2005,226). ඒ සඳහා පැරණි ලක්දිව රජවරුන්ට ආභාසය ලැබුණේ බෞද්ධ සූත්‍රගත කරුණු තුළිනි. ඒ අනුව එවැනි කාලවල රජු රතන සූත්‍රය කියවීම අරඹන ලදී (*සි.ම.ව.*, 1996, 36:82.90, 37:189.198,159, 171). ජනතාවට ලෙඩරෝග වැළඳුණ විට සුවය ලබාදීමට කටයුතු කිරීම ද කටයුතු කිරීම ද රජුගේ ප්‍රධාන කටයුත්තක් විය. සත්‍ය වශයෙන් ම ධර්මාශෝක රජතුමා මිනිසුන්ට හා සතුන්ට ප්‍රයෝජනවත් වන ඖෂධ පැළෑටි මග දෙපස රෝපණය කරවූයේ ද, මිනිසුන්ට හා සතුන්ට අවශ්‍ය චිකිත්සා ක්‍රම කරවූයේ ද (ආරියසිංහ, 2000,45) මේ අදහසින් වන්නට ඇත.

මේ තත්ත්වය පැරණි ලංකාවේ ද දැකගත හැකි ය. එනම්, බුද්ධදාස රජු ලෙඩරෝග වැළඳුණවුන්ට සුවය ලබාදෙනු පිණිස වෛද්‍ය කටයුතු සංවිධානය කොට තිබේ. මේ අනුව රජය මගින් වෙදුන් පත් කරන ලද බව ද, රෝහල් පිහිටුවන ලද බව ද, ඖෂධයන් සුලබ කළ බව ද මහාවංසයේ සඳහන් වේ (*සි.ම.ව.,* 1996, 37:145.150,179). මේ ආකාරයෙන් මහජන සුභසාධක කටයුතු සිදුකිරීම ද රජුගේ ප්‍රධාන කාර්යයක් වූයේ ය. සැබැවින් ම ධර්මාශෝක

අධිරාජයා අනුගමනය කළ ප්‍රතිපත්තීන්හි ආභාසය මෞරට පාලකයන්ට ද ලැබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

එමෙන් ම රජු උද්‍යෝගී සම්පන්න අනලස් තත්ත්වයෙන් සිටින්නට නම්, නියමිත කාලසටහනක් අනුව කටයුතු කිරීම ඉතා වැදගත් ය (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ සහ ඉන්ද්‍රවංස ස්ථවිර, හීනිපැල්ලේ, 1962,28). එය කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ අවධාරණය කොට තිබේ. ඒ අනුව කෞටිල්‍ය දිවා කාලය නාලිකා අටකට බෙදයි.

| | |
|---|---|
| පළමුවන නාලිකාව | ආරක්ෂකයන් යෙදවීම |
| | අයවැය සමාලෝචනය |
| දෙවන නාලිකාව | ගැමි සහ නාගරික ජනතාවගේ කටයුතු සංවිධානය |
| තෙවන නාලිකාව | ආහාර ගැනීම |
| | ස්නානය, අධ්‍යයන කටයුතු |
| සිව්වන නාලිකාව | අධ්‍යක්ෂකවරු පත් කිරීම වැනි කටයුතු |
| පස්වන නාලිකාව | ඇමතිවරු හා එක් ව අණපණත් නිකුත් කිරීම |
| සවන නාලිකාව | චරපුරුෂයන් විසින් එකතු කළ තොරතුරු විශ්ලේෂණය |
| සත්වන නාලිකාව | සිව්රඟ සේනාව පිරික්සීම |
| අටවන නාලිකාව | සේනාපති සමග එක් ව ආරක්ෂක විධිවිධාන පරීක්ෂාව |

(*කෞ.අ.ශා.*, 2003, 1.2 අධිකාර, 16 ප්‍රකරණය, 7:23,105.106)

දිවා කාලය අවසානයේ සන්ධ්‍යා යාඥාව සිදු කිරීමට නිර්දේශ කර තිබේ. මෙලෙස ම රාත්‍රී කාලයත් නාලිකා අටකට බෙදනු ලැබේ. එනම්,

| | |
|---|---|
| පළමුවන නාලිකාව | රහස්‍ය දූතයන් හමුවීම |
| දෙවන නාලිකාව | ස්නානය |
| | රාත්‍රී ආහාරය සහ අධ්‍යයනය |
| තෙවන නාලිකාව | සංගීත ශ්‍රවණය |
| සිව්වන නාලිකාව | නිදියහනට යාම |
| පස්වන නාලිකාව | නින්දේ සිට කල්ගත කර බෙර හා මිණි හඬින් අවදිවීම |
| සවන නාලිකාව | විනෝදාංශවල යෙදීම |
| සත්වන නාලිකාව | පරිපාලන විධිවිධාන ගැන සිතීම |
| | චරපුරුෂයන් යැවීම |
| අටවන නාලිකාව | පුරෝහිත, රාජකීය වෛද්‍ය, අරක්කැමියා, නක්ෂත්‍ර ශාස්ත්‍රඥයා හමුවීම |

(*කෞ.අ.ශා.*, 2003, 1.2 අධිකාර, 16 ප්‍රකරණය, 7:23,105.106)

මෙලෙස ඉතා කාර්යබහුල දින චර්යාවක් කෞටිල්‍ය නිර්දේශ කර තිබුණ ද රජුගේ ශරීර සුවතාව සහ හැකියා අනුව ඒවා වෙනස්කර ගැනීමට අවසර දී තිබේ. මෙසේ භාරතයේ පැවතියා වූ මෙම මූලධර්මය මෙරට පාලකයන්ට ද පැවති බව පෙනේ. කඳවුරු සිරිතෙහි දැක්වෙන දෙවන පරාක්‍රමබාහු රජුගේ දින චර්යාව සකස් වූ ආකාරය මීට කදිම නිදර්ශනයකි. කඳවුරු සිරිත ශ්‍රීමත් ඩී.බී.ජයතිලක මහතා විසින් ප්‍රකාශයට පත්කරන ලද්දේ ලන්ඩන් නගරයේ ජාතික පුස්තකාලයේ තිබී පිටපත් කරගෙන ඒමෙන් අනතුරු ව යි (ද ලැනරෝල්, ජුලියස්, 1956,63). මෙම දින චර්යාව සහ කෞටිල්‍ය දක්වන රජෙකුගේ දින චර්යාව සකස්විය යුතු ආකාරය අතර ඇත්තේ පුදුමාකාර සමානත්වයකි. මේ අනුව දෙවන පරාක්‍රමබාහු රජුට කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ එන රාජ්‍ය පාලන මූලධර්මයන්හි ආභාසය නිශ්චිත වශයෙන් ම ලැබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. මෙම ග්‍රන්ථය ආරම්භයේදී ම,

> "කඳවුරු නුවර රාජ්‍යප්‍රාප්ත කලිකාල සාහිත්‍ය සර්වඥ ශ්‍රී පණ්ඩිත
> පරාක්‍රමබාහු මහරජ්ජුරුවන් වහන්සේ ශාස්ත්‍ර ක්‍රම නොවරදවා
> දවස් පතා පැවති දින චර්යාව නම්,"

යනුවෙන් සඳහන් වේ (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,67). මේ වාක්‍යයෙන් රජු වාසය කළ නගරය "කඳවුරු නුවර" යනුවෙන් හැඳින්වූ බව පෙනේ. පුංචිබණ්ඩාර සන්නස්ගල පවසන්නේ මේ කඳවුරු සිරිත පරාක්‍රමබාහු රජුව ඔහුගේ පුත්‍රයා විසින් පොළොන්නරුවට කැඳවාගෙන යාමෙන් අනතුරු ව එහි විසූ කාලය තුළදී සකස් ව පැමිණි එකක්දැයි සිතීමට ද බැරිකමක් නැති බව යි (සන්නස්ගල, පුංචිබණ්ඩාර, 2013,183). එය නිරවද්‍ය නම් මේ ලේඛනය ලියවී තිබෙන්නේ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ අවසාන කාලයේදී ය. නමුත් මෙය නිශ්චිත ව කිව හැකි නොවේ. එනම්, "සිංහාසනාරූඪ ව වැඩ හිඳ" (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,72) යනුවෙන් සඳහන් වන කඳවුරු සිරිත් පාඨය තුළින් මේ කෘතිය ලියවී තිබෙන්නේ රජුගේ රාජ්‍ය අවස්ථාවක ම බව පෙනේ.

යම්කිසි කාල සටහනකට අනුව දෛනික වැඩ කටයුතු සිදු කිරීම බුදුරජාණන් වහන්සේ පවා අනුදැන වදාළ උතුම් විධියකි. කෙසේ වෙතත් රටේ ප්‍රථම පුරවැසියා වශයෙන් රජතුමා කාල සටහනකට අනුව කටයුතු කළ ආකාරය කඳවුරු සිරිතෙන් මොනවට පැහැදිලි වේ. ඒ අනුව,

> 01. කැටපත් ගෙට වැඩමකර ඉරිදා දවස් වුව කුංකම වර්ණ සළු වඩා පද්මරාග ආභරණ පැළඳ......
>
> 02. සිකුරාදා දවස් වුව සුදු සළු වඩා වීදුරු පළඳනා හෝ මුක්තාභරණ හෝ පැළඳ....
>
> (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,70)

යන පාඨයන්ගෙන් රජතුමා ඒ ඒ දිනයන්හිදී නොයෙක් වර්ණයෙන් යුතු වස්ත්‍රවලින් සැරසුණු ආකාරය පැහැදිලි වේ.

03. සිංහාසනාරූඪ ව හිඳ දානශාලාවෙහි ලේකම් පළමුවෙන් අසා භාණ්ඩාගාරයෙහි අයවියදම් එදවස අතසුරු අසා......

(*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,71)

කඳවුරු සිරිතේ එන මෙම පාඨය කෞටිල්‍ය විසින් ඉදිරිපත් කර තිබෙන දිවා කාලයේ පළමුවන නාලිකාවේ කළ යුතු කාර්යය හා සමාන යි (*කෞ.අ.ශා.*, 2003, 1.2 අධිකාර, 16 ප්‍රකරණය, 7:23,105.106).

04. මහ නැකතිනාවන් විෂ සටිකාදී දෝෂ රහිත ව වේලා දැන්වූ කල්හි මුළුගිනාවන්, මහවෙදනාවන්, සමග වැ එළවූ රත්හැල් නැගී එළවූ අටබත් තුන්සිය අටමාළු පූපාපූප එලාඑල වර්ගයෙන් මෙහෙ නිමවන කල

05. නිති දවසේ රජගෙයි වළඳන සඟ සියයක් දෙනා වහන්සේ......

(*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,71)

සත්‍ය වශයෙන් ම උක්ත පාඨයන්ගෙන් පෙනී යන්නේ මෙරට පාලන මූලධර්ම සකස්වීම කෙරෙහි භාරතීය රාජ්‍ය පාලන මූලධර්මයන්ගේ බලපෑම යම් ආකාරයකින් තිබුණ ද ලංකාවේ පාලන මූලධර්ම සකස්වූයේ මෙරටට අනන්‍ය ස්වරූපයකින් බව යි. බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේ පාලනය වුව හැඩ ගැසුණේ බුදුදහම අනුව යි.

06. බැමිණියෝ කෙස් නිය පහරවති. යහන් තැන් හුන් ගැප් ගෙදොරකඩ රැකවල් ගෙන සිටිත්.

07. සේනානායක, ඒකනායක, භාණ්ඩාගාරික, දිශානායක, අධිකාරනායක, සාමන්තනායක, අර්ථනායක, රටනායක, මුදළිනායක, බඳුනායක, දහම් පසක්නා, මහවියත්නා, මහ නැකතිනා, මහවෙදනා, සිඟානා, දහම්ගෙයිනා, මහවෙළඳනා, සිටුනා, මුළුගිනා, අරක්මේනා, මහදොරනා, කිලිංනා, කපුනා, මේ ආදීවුන් පිරිවරා රටතොට ගම් නියම්ගම් ආදීහු අමුතුපත් පනත් අසා.....

(*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,71.72)

08. බොජුන්ගෙට වැඩ මෙහෙ නිමවා සක්මන් කොට නව අරහාදී බුදුගුණ සිහිකැරැ යහන් නැගී බුලත් වඩා මෙසේ පද සමාරක් යවා බිසෝ රජගෙට වැඩැ පස්පැයක් පුරා එයින් නැගී සදලුවැඩ....."

(*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,72.73)

සමස්තයක් වශයෙන් ගත්කල දෙවන පරාක්‍රමබාහු රජුගේ දින චර්යාව කෞටිල්‍ය දක්වන රජෙකුගේ දින චර්යාව සකස්විය යුතු ආකාරය අතර ඇත්තේ පුදුමාකාර සමානත්වයකි. නමුත් එය බෞද්ධ රජ කෙනෙකුට සුදුසු පරිදි සකස් වී ඇත. හිරු උදාවීමටත් පැය දෙකකට පෙර පිබිද ප්‍රථමයෙන් ම සිදු කරනු ලබන්නේ ත්‍රිලක්ෂණ භාවනාව වැඩීම යි. එය ඉහත අදහසට මනා නිදර්ශනයකි.

"පද්මාසනයෙහි වැඩ හිඳ අනිත්‍යය දුක්ඛය

අනාත්මය යන ත්‍රිලක්ෂණ භාවනාවෙන් යෙදී....

ඉන්පසු එතුමා පිරිත් සූත්‍ර කිහිපයක් සජ්ඣායනා කිරීමටත්, දහම් පාඨ කටපාඩම් කිරීමටත් ස්වල්ප වේලාවක් යොදාගනී. එපමණක් නොව, ශරීර කෘත්‍යය සිදුකිරීමෙන් අනතුරු ව රජතුමා දළදා මාළිගාවේ උඩුමහලට ගොස් රත්‍රංවලින් සහ කෙස්වලින් සැකසූ මුස්නෙන් එම ස්ථානය පවිත්‍ර කරයි. පසු ව සොළොස් ආකාරයකින් වන්දනා කොට මලු පුදා දළදා වහන්සේ ඉදිරියේ සිල් සමාදන් වෙයි. තවත් මොහොතක රත්‍රං තෙළිතුඩින් ප්‍රතිමා වහන්සේගේ නේත්‍රා තබා දහම් ග්‍රන්ථ පරීක්ෂා කර ධර්මය අසයි (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,67.73).

මේ ආකාරයෙන් ලාංකේය රජතුමාගේ දින චර්යාව සකස් වූයේ බෞද්ධ සමාජයකට උචිත වන පරිදි ය. ඒ අනුව කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ ඉගැන්වෙන දින චර්යා ක්‍රමය පැරණි සිංහල රජවරුන් විසින් එලෙසින් ම අනුගමනය කරන ලදැයි සිතිය නොහැකි බව පෙනේ. එහෙත් තරමක් දුරට හෝ හින්දුන්ගේ එම ඉගැන්වීම් ලාංකික රජදරුවන්ට බලපාන්නට ඇත (*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* 1997,35).

ඒ අනුව හින්දු චාරිත්‍ර වාරිත්‍ර හා ඉගැන්වීම් , බෞද්ධ සිරිත් විරිත් හා ඉගැන්වීම් අනුව සකස් කරගත් පොදු දින චර්යාවක් කඳවුරු සිරිතේ සඳහන් වෙතැයි සිතිය හැකි ය. මේ අනුව කඳවුරු සිරිතේ දැක්වෙන භාරතීය දේශපාලඥයන්ගේ හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල ඉගැන්වීම්, බෞද්ධ ස්වරූපයෙන් සකස් කරගන්නා ලද බව පැවසිය හැකි ය. රජුගේ තවත් ප්‍රධාන කාර්යයක් වූයේ සමාජයේ සාමයත්, සමගියත් ඇති කිරීම ය (*ලං.වි.ලං.ඉ., I.II භාගය,* 507).

ඒ සඳහා රජු පැරණි නීතිරීති හා සංස්ථා නොකඩවා පැවැත්වීම අවශ්‍ය වූයේ ය. එමෙන් ම රජු රට පාලනය කළ යුතු වූයේ චතුර්විධ උපායමාර්ග අනුව බව භාරතීය ඇතැම් මූලාශ්‍රය අවධාරණය කළ ද (*කෞ.අ.ශා.,* 2003, 1.2 අධිකාර, 9 ප්‍රකරණය, 16.19,69) ලංකාවේ මේ අතරින් කැපී පෙණුනේ සාමයෙන් හා දානයෙන් යුතු ව පාලන කටයුතු ගෙනයාම යි. මේ ප්‍රතිපත්තිය ඇතැම් භාරතීය මූලාශ්‍රයන්හි ද අවධාරණය කර තිබේ. ශුක්‍රනීතිසාරයේ,

"ස්ව ප්‍රජානාං න භෙදෙන නෛව දණ්ඩෙන පාලනම්

කුර්වීත සාම දානාභ්‍යාං සර්‍වදා යත්නමාස්ථිතං"

(*Shukra Neethisara,* 1915, 4:38,131)

යනුවෙන් සඳහන් වේ. එනම්, ශුක්‍ර පවසන්නේ රජු ස්වකීය ප්‍රජාව භේදයෙන් හෝ දඬුවමෙන් පාලනය නොකළ යුතු බවත්, සැම විට ම සාමයෙන් හා දානයෙන් ඔවුන් පාලනය කිරීමට උත්සාහ ගත යුතු බවත් ය. රජුගේ කාර්යභාරය විමර්ශනය කර බැලීමේදී මනු සඳහන් කරන්නේ බමුණන්ට සේවය කිරීම රජුගේ ප්‍රධානතම කාර්යයක් බව යි.

"ශුශ්‍රෑෂා බ්‍රාහ්මණානාං ච රාඥං ශ්‍රේයස්කරං පරම්"
(*මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය*, 2001, 7:88,307)

නමුත් පැරණි ශ්‍රී ලංකාවේ පාලන මූලධර්ම දෙස බැලීමේදී එවැන්නක් දක්නට නොලැබේ.

## නිගමනය

සමස්තයක් වශයෙන් ගත් කළ පෙනී යන වැදගත් කරුණක් වන්නේ ලාංකේය පාලන මූලධර්ම කෙරෙහි භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම බලපෑව ද ලංකාව තුළ එම මූලධර්ම ක්‍රියාවට නැංවූයේ මෙරටට ගැළපෙන පරිද්දෙන් බව යි. වෙසෙසින් ම අප නරපතියන් භාරතීය කෘතීන්ගෙන් උකහා ගත්තේ බෞද්ධ රාජ්‍යයකට අවශ්‍ය මූලධර්ම පමණි. ඒ අනුව අප රටට ම ආවේණික වූ ආකාරයෙන් මෙරට පාලන සංවිධානය සකස් වූ ආකාරය දැකගත හැකි ය. එසේ ම භාරතය වූ කලී විශාල රටකි. එහි සැකසුණු සියලු මූලධර්ම ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට සර්ව ප්‍රකාරයෙන් ගැළපුණේ නැත. එහෙයින් අවශ්‍ය දේ පමණක් ලබාගෙන මෙරටට අනන්‍ය වූ ආකාරයකින් මෙරට පාලකයන් ස්වකීය කාර්යභාරය ඉටු කළ බව කිව හැකි ය.

කෙසේ වෙතත් භාරතය සහ ලංකාව යන දෙරට ම ගත් කල මේ දේශ දෙකේ ම පාලකයා ජනතාවගේ රක්ෂකයෙකු වූවා මිස භක්ෂකයෙකු නොවී ය. එසේ ම රජු ජනතාවගේ පෝෂකයා වුවද ශෝෂකයෙක් නොවී ය. (පඤ්ඤාකිත්ති හිමි,63) ඒ අනුව රජු තම නිලධාරි මණ්ඩලයේ ද සහයෝගය ලැබ ඉතා හොඳින් තම කාර්යය ඉටු කළ යුතු බවට දෙරටේ ම පොදු පිළිගැනීම විය. මෙතෙක් දැක්වූ කරුණු අනුව අවසාන වශයෙන් මෙරට රජුගේ කාර්යභාරය සකස්වීම කෙරෙහි භාරතීය රාජ්‍ය පාලන මූලධර්මයන්ගේ බලපෑම පැවතිය ද මෙරටට සුවිශේෂ වූ ආකාරයෙන්, මෙරටට ගැළපෙන පරිදි එකී මූලධර්ම උකහාගත් බව පෙන්වාදිය හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

*ඌනපූරණ සහිතො මහාවංසො* (1996), බුද්ධදත්ථ ථෙර, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

*කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය* (2003), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (අනු.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*ගිරා සන්දේශය* (1991), ප්‍රේමරත්න, කේ.ජී. (සංස්.), ලිහිණි ප්‍රකාශන, කොළඹ.

*ජාතකට්ඨ කථා* 1 කොටස (2007), චන්දකිත්ති හිමි, යාලේගම (පරි.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*දඹදෙණි අස්න හා කඳවුරු සිරිත,* (1997), ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ (සංස්.), තිලක් ප්‍රකාශන.

*පූජාවලිය,* (1926), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

*පූජාවලිය* (2013), නාරම්පනාව, කීර්ති (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*බුත්සරණ* (1998), මොරටුවගම, එච්.එම්. (සංස්.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය* (2001), සෙනෙවිරත්න, ආරියදාස (අනු.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*මහාභාරතය* (2006), පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (පරි.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*වංසත්ථප්පකාසිනී* (2006), අමරවංස හිමි, අකුරටියේ සහ දිසානායක හේමචන්ද්‍ර (අනු.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*සද්ධර්මාලංකාරය* (2011), ධර්මකීර්ති හිමි, දේවරක්ෂිතාභිධාන ජයබාහු හිමි (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*සාරාර්ථ සංග්‍රහය* (1929), හේවාවිතාරණ මුද්‍රණය.

*සිංහල මහාවංසය* (2004), ශ්‍රී සුමංගල මාහිමි සහ දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ (පරි.), රත්න පොත් ප්‍රකාශන, කොළඹ.

*සුමංගලවිලාසිනී නම් වූ දීඝනිකායට්ඨකථා-1 කොටස* (2014), ගුණසේකර, දයා (පරි.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ.

*Epigraphia Zeylanica-Vol. 1-4* (1941), Published for the Government of Ceylon.

*Shukra Neethisara* (1915), Sarkar, C.F.

ආරියසිංහ, අභය (2000), *අශෝක ධම්ම ලිපි,* කර්තෘ ප්‍රකාශන.

ඉලංගසිංහ, මංගල (2008), *පෙරදිග දේශපාලන චින්තනය,* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ගුණරත්න, කෝණාර (1966), *ලංකා ඉතිහාස විමර්ශන,* අනුල මුද්‍රණය.

ද ලැනරෝල්, ජුලියස් (1956), *සිංහල සාහිත්‍ය ලිපි.*

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (2001), *පුරාතන භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම,* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පරණවිතාන, සෙනරත් සහ වෙනත් අය (1964), *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය, 11 භාගය,* විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ප්‍රකාශනය.

බෂාම්, ඒ.එල්. (1995), *අසිරිමත් ඉන්දියාව,* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

බස්නායක, එච්.ටී. (2005), *ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය,* ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

මොරටුවගම, එච්.එම්. (2005), *බෞද්ධ ඉතිහාසය සහ සංස්කෘතිය,* බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

ලියනගමගේ, අමරදාස සහ ගුණවර්ධන, රණවීර (2006), *අනුරාධපුර යුගය,* ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ සහ ඉන්ද්‍රවංස ස්ථවිර, හීනිපැල්ලේ (1962), *ඉතිහාස සංග්‍රහය,* ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

සන්නස්ගල, පුංචිබණ්ඩාර (2013), *සිංහල සාහිත්‍ය වංශය,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සේනානායක, ජී.එස්.බී. (1965), *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය,* ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.